සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - චිත්‍ර කලාව

සැප්තැම්බර් 04 සතිය

ශ්‍රේණිය - 10 (III වාරය)

සැකසුම - රූපිකා ජයන්ති (සිරිසමන් ජා. පා.)
දැරණියගල කොට්ඨාසය

පාඩම/ඒකකය - 4.2.1 පද්‍ය පන්තියකට සන්නිදර්ශන චිත්‍රයක් අඳිමු

## පද්‍ය පන්තියකට සන්නිදර්ශන චිත්‍රයක් අඳිමු

1. ඉගෙනුම් ආධාරක

- පුවත්පත්වල, නිසදැස්, කෙටිකතා, නවකතා ආදියට කරන ලද සන්නිදර්ශන චිත්‍ර කිහිපයක්





2. ක්‍රියාකාරකමෙහි නිරත වීමට උපදෙස්

- සන්නිදර්ශන චිත්‍රයක් ලෙස හඳුන්වන්නේ,
    - නිසදැසකට
    - පද්‍ය පන්තියකට
    - නවකතාවකට
    - කෙටිකතාවකට එහි අර්ථය වඩා තීව්‍ර ලෙස දැක්වීමට යොදා ගන්නා චිත්‍ර යි
- අඳිනු ලබන චිත්‍ර,
    - ස්වභාවික ලෙස
    - රේඛා චිත්‍රයක් ලෙස
    - නිර්මාණාත්මකව
    - සාම්ප්‍රදායිකව, ආදී ඕනෑම ආකාරයකට ඇඳිය හැකි ය
- මේවා අයත් වන්නේ ග්‍රැෆික් චිත්‍ර ගණයට ය
- මෙම චිත්‍රවල රිද්මයානුකූල බවක් තිබිය යුතු ය

3. ඇගයීම

1. ඔබ කැමති සරල පද්‍ය පන්තියක් හෝ ඔබ කිය වූ කෙටිකතාවක කොටසකට හෝ නවකතාවක කොටසකට මැවෙන සිතුවමක් චිත්‍රයට නගන්න.

2. දළ සටහනක් ද ඇඳගත හැකි ය.

3. මෙවැනි චිත්‍ර ඇඳීමේ දී විවිධ චිත්‍ර ශිල්පීන්ගේ චිත්‍ර ලක්ෂණ ද ඔබේ චිත්‍රවලට ආදර්ශ කරගැනීමට හැකි ය.

4. ඕනෑම පැස්ටල්, දියසායම් වැනි වර්ණ මාධ්‍යයක් භාවිත කර චිත්‍රය වර්ණ ගන්වන්න. නිර්මාණශීලීව, නිදහස්ව චිත්‍රය ගොඩනගන්න.

5. පැය දෙකක කාලයක දී අලංකාර චිත්‍රයක් නිමා කරන්න.